# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1815/15 - 2013 ජුනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනත (235 වැනි අධිකාරය)

**10(අ) වැනි වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය) වන රේගු ආඥාපනතේ 10(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් වරණීය හා සාමාන්‍ය තීරු බද්ද මත සියයට 100ක අධිභාරයක් 2013 ජුනි මස 21 වැනි දින සිට මාස 06ක කාලසීමාවක් බලපවත්වන පරිදි මෙම නියෝගයෙන් පනවමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.)

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

235 වැනි අධිකාරය වූ රේගු ආඥාපනතේ 10(අ) වගන්තිය යටතේ වූ උක්ත නියෝගය, එකී ආඥාපනතේ "අ" උපලේඛනය වූ තීරු ගාස්තු නාමාවලියේ පහත දැක්වෙන පරිච්ඡේද, ශීර්ෂ හා උප ශීර්ෂයනට ගැනෙන භාණ්ඩ සම්බන්ධයෙන් බල පැවැත්වේ.


1A - PG 001657 — 960 (2013/6)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| උපලේඛනය | | | |
|---|---|---|---|
| *ශීර්ෂ අංකය* *(1)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* *(2)* | | *විස්තරය* *(3)* |
| 71.08 | | | සකස් නොකළ හෝ අඩ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත්, හෝ කුඩු ආකාරයෙන් වූ, රත්රන් (ප්ලැටිනම් සමග ආලේපිත, රත්රන් ඇතුළුව) |
| | | | |
| | | - | මුල්‍ය නොවන : |
| | 7108.11 | -- | කුඩු |
| | 7108.12 | -- | අනෙකුත් සකස් නොකළ |
| | 7108.13 | -- | අනෙකුත් අර්ධ වශයෙන් නිෂ්පාදිත ස්වරූපවලින් යුත් |
| | 7108.20 | - | මුදල් හා සම්බන්ධ වූ (මූල්‍යමය) |

07 - 139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.